## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කර ඇති මෝටර් රථ ටයර් අපහරණය කිරීම - එස්.ආර්.එස්/එෆ්.7426

(1) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පවතින භාවිතයෙන් ඉවත් කර ඇති මෝටර් රථ ටයර් අපහරණය කිරීම සඳහා **2024.05.09 දින ප.ව. 02.00** දක්වා මිල ගණන් භාරගනු ලබයි.

(2) **රු.5,000.00** ක ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තුවක් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත ගෙවා, කොළඹ 10, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන) උප දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් II ශාඛාව වෙතින් ලබා ගත හැකි මිල දීමනා ආකෘති පත්‍ර මඟින් පමණක් මිල දීමනා ඉදිරිපත් කළ යුතුය.

(3) සම්පූර්ණ කරන ලද මිල දීමනා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි නමින් ආපසු ගෙවනු ලබන **රු.30,000.00** ක ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කල යුතුයි.

(4) මිල ගණන් ඉදිරිපත් කරන අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"භාවිතයෙන් ඉවත් කරන ලද මෝටර් රථ ටයර් අපහරණය කිරීම සඳහා මිල ගණන් 2024"** යනුවෙන් හා ගැණුම්කරුවන්ගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය.

(5) තෝරාගත් වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් මිලදී ගැනීමට පෙර **මුළු ලංසු වටිනාකමින් 10%** ක මුදලක් (ආපසු ගෙවන) ආරක්ෂක ඇපයක් වශයෙන් තැන්පත් කල යුතුය.

(6) එසේම මෙම ඇපකරය අදාල භාණ්ඩ දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපළවලට හෝ සේවකයන්ට හානියක් සිදු නොවන ලෙස නියමිත කාල සීමාව තුළ ලබාගැනීමෙන් පසු පමණක් නැවත ලබා දෙනු ලැබේ.

(7) බර පදනම යටතේ මිල ගණන් කැඳවන අයිතම සඳහා බර දක්වා ඇත්තේ ආසන්න වශයෙනි. එහෙත් තෝරාගත් වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති අයදුම්කරු එම භාණ්ඩ ඉවත් කර ගැනීමේදී නැවත බර කිරීමෙන් පසු ලබාගන්නා සත්‍ය බර මත පදනම්ව ගෙවීම් කළ යුතු වේ. ඒ අනුව එම අයිතම සඳහා ගෙවන ලද මුදල එම අයිතමයන්හි සත්‍ය බරෙහි වටිනාකමට වඩා අඩු නම් අදාල හිඟ මුදල භාණ්ඩ ඉවත් කර ගැනීමට පෙර ගෙවා සම්පූර්ණ කළ යුතුය. එමෙන්ම කිසියම් අතිරික්ත මුදලක් ගෙවා ඇත්නම් එම මුදල නැවත ගෙවනු ලැබේ.

(8) භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කර එම භාණ්ඩ මිලදී ගැනීමට ඉදිරිපත් නොවන ගැණුම්කරුවන්ගේ ඇප මුදල් රාජසන්තක කරනු ලබන අතර මින් පසු කිසිදු මිල ගණන් කැඳවීමකට සහභාගී විය නොහැකි ලෙස අසාධු ලේඛනගත කරනු ලැබේ. එසේම එම භාණ්ඩ පිළිබඳ විස්තර සොයා නොබලා මිල ගණන් ඉදිරිපත් කිරීම වෙනුවෙන් පැන නගින ගැටළු පිළිබඳ පැමිණිලි භාරගනු නොලැබේ.

(9) ගැණුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී තම මනාපය පරිදි තෝරා ගන්නා එක් එක් ස්ථානයන්හි ඇති ටයර් තොගයම මිල දී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

Information Copy - Not for Bidding

(10) නියමිත දින වලදී අදාල ටයර් පරීක්ෂා කර බලා ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අයදුම්පත්වල පමණක් මිල ගණන් සටහන් කර කවරවල බහා, සීල් තබා **2024.05.09 දින ප.ව. 02.00** ට **හෝ ඉන් පෙර පහත ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුවේ.**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත,**
**කොළඹ 10.**

(11) **2024.05.09 දින ප.ව. 02.00** ට මිල දීමනා පත් විවෘත කරනු ලැබේ.

(12) එක් එක් පරිශ්‍රයන් හි ඇති අයිතම වෙන් වෙන් වශයෙන් ඇගයීමට ලක් කිරීම හා ප්‍රදානය කිරීම සිදු කෙරේ.

(13) මෙම අයිතම ඇණවුම් ලිපිය ප්‍රදානයේ සිට **දින 07 ක් ඇතුලත සම්පූර්ණයෙන් ඉවත් කරගත යුතුයි.**

(14) ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවට අයත් ටයර් නිකුත් කරනුයේ බර පදනමින් වන අතර අනෙකුත් උප දෙපාර්තමේන්තුන්හි ටයර් තොග පදනමින් නිකුත් කරනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදන)
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

Information Copy - Not for Bidding